පසුගියදා ශිෂ්‍යත්ව විභාගය සම්බන්ධව වාර්තා කිරීමේදී, සිය මව මියගොස් ඇති බව නොදැන ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි දරුවෙකු පිළිබඳ පුවතක්ද මාධ්‍ය මගින් වාර්තා කර තිබිණි. මෙහිදී උදෑසන දරුවා විභාගයට යෑමට සූදානම් වීම සහ විභාගයට පිටත්ව යෑමද වීඩියෝ දර්ශන ලෙසින් පෙන්වා දෙන අද දෙරණ පුවත් විකාශය මගින්, දරුවා නැවත පැමිණි පසු මවගේ දේහය අසල හඬා වැලපෙන සංවේදී දර්ශනද පෙන්වා දෙයි. එසේම මව්බිම පුවත්පතේ මෙම සිදුවීම පිළිබඳව පළවූ ලිපිය තුළද, මවගේ දෙණ අසල සිටින දරුවාගේ සේයාරුවක් දක්වා තිබේ.

ජාත්‍යන්තර මාධ්‍ය ආචාර ධර්ම මගින් පෙන්වා දෙන්නේ, ශෝකයට හා කම්පනයට පත්ව සිටිනා සමීපතමයින්ව මාධ්‍ය මගින් පෙන්වා දීමේදී අතිශයින්ම සංවේදී ලෙසින්, ප්‍රවේසම් සහගත ප්‍රවේශයකින් යුතුව කටයුතු කරන ලෙසයි. විශේෂයෙන්ම එවන් අවස්ථාවන් වල දරුවන්ගෙන් ප්‍රශ්න ඇසීමේදී හා ඔවුන්ව ඡායාරූපගත/වීඩියෝගත කිරීමේදී විශේෂයෙන් සැලකිලිමත් වන ලෙසත්, හැකි සෑම විටම ඒ සඳහා මාපිය/භාරකාර අවසරය ලබාගන්නා ලෙසත් එම ආචාර ධර්මයන් සම්පාදනයන් තුළ වැඩිදුරටත් දැක්වේ.

ඒ අනුව අපට ඇසීමට ප්‍රශ්න කිහිපයක් ඉතිරි වේ.

1) මාධ්‍ය මගින් මෙම අවස්ථාවේදී අවස්ථානුකූල සහකම්පනයෙන් සහ සංවේදීතාවයෙන් යුතුව ක්‍රියා කර නොමැත්තේ මන්ද? මෙම පුවත වාර්තා කළ අනෙකුත් පුවත් විකාශයන් තුළ දරුවා මවගේ දෙණ අසල හඬා වැලපෙන සංවේදී දසුන් ඇතුළත් නොවූ බවද දැක්විය යුතු වේ.

2) දරුවා විභාගයට යෑමට සූදානම් වීමේ සිට, දරුවා විභාගය අවසන්ව පැමිණ මවගේ දෙණ අසල හඬන තැන් දක්වා දසුන් රූගත කොට ඉදිරිපත් කිරීම ඔස්සේ, පුවත් වාර්තාවකට වඩා භාවාතිශය කතාන්තරයක් ඉදිරිපත් වී ඇතැයි ඔබ නොසිතන්නේද? මෙහි ප්‍රවෘත්තියකට ප්‍රමුඛත්වයක් ලැබී ඇතැයි සිතිය හැකිද?

3) මෙය අනවශ්‍ය ලෙසින් සංවේගය උලුප්පාලන ආකාරයේ මාධ්‍යකරණයක් නොවේද?

මූලාශ්‍ර:

https://www.afp.com/.../12_april_2016_afp_ethic_final.pdf...

https://accountablejournalism.org/.../Tanzania...

https://www.ipso.co.uk/.../deaths-and-inquests-guidance/...

**#MediaEthicsSL #lka #SinhalaPress #TV #News #Mawbim #TVDerana**